# වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

# வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றும்

# ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS

# 2013



## පුනරුත්ථාපන අධිකාරිය

## புனர்வாழ்வு அதிகாரசபை

## REHABILITATION AUTHORITY

අංක.59, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ – 08.
இல.59, டீ. எஸ். சேனாநாயக மாவத்தை, கொழும்பு - 08.
No.59, D. S. Senanayaka Mawatha, Colombo - 08.

# පටුන

01. පිළිගැන්වීමේ ලිපිය.

02. වාර්ෂික වාර්තාව.

03. වාර්ෂික ගිණුම්.

04. විගණකාධිපතිගේ වාර්තාව.

05. විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ.

# පිළිගැන්වීමේ ලිපිය.

පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා
හින්දු ආගමික කටයුතු අමාත්‍ය,
ගරු ඩී. එම්. ස්වාමිනාදන් මැතිතුමා,
පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය,
නො. 146, ගාලුපාර, කොළඹ 03.

ගරු ඇමතිතුමනි,

**1971 අංක 38 දරණ මුදල් පනත සහ1987 අංක 29 දරණ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරී පනතේ විධිවිධාන ප්‍රකාර තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2013 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබතුමා වෙත සතුටින් පිළිගන්වමි.**

මෙයට - **විශ්වාසී,**

**එන්. පත්මනාදන්**
**සභාපති,**
**පුනරුත්ථාපන අධිකාරිය.**

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය,
අංක.59,
ඩී. එස්. සේනානායක මාවත,
කොළඹ – 08.

## දැක්ම

පුනරුත්ථාපනය තුළින් ආර්ථික හා සාමාජීය සෞභාග්‍ය උදා කිරීම.

## මෙහෙවර

ජනවාර්ගික ගැටුම්, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හා ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් විපතට පත් ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කර පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ තුළින් සංවර්ධනාත්මක සමාජ ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම.

# වාර්ෂික වාර්තාව - 2013
# තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය
# පුනරුත්ථාපන අධිකාරිය

වර්ෂ 1987 අංක 29 දරණ පනත මඟින් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය ( පුනරුත්ථාපන අධිකාරිය ) පිහිටුවන ලදී.

2013 වර්ෂයේ දී පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය.

01. ඊ. ඒ. සමරසිංහ මහතා - සභාපති
02. ඩී.කේ. ජිනදාස මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
03. ඒ. සමුන් කලීල් මහතා - අධ්‍යක්ෂ
04. ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා - අධ්‍යක්ෂ

ත්‍රස්තවාදී ක්‍රියා, මහජන කැළඹීම්, දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා වලින් විපතට පත් පුද්ගලයින්ට, දේපළ සහ කර්මාන්තවලට සහන සැලසීම හා පුනරුත්ථාපනය කිරීම පුනරුත්ථාපන අධිකාරියට අයත් කාර්ය භාරය වන අතර, එම කාර්යයන් පහත දක්වේ.

## (අ).ව්‍යවස්ථාපිත කාර්යයන්

**(අ).** ත්‍රස්තවාදී ක්‍රියා නිසා විපතට පත්වූවන්ට සහන සැලසීම.

**(ආ).** විනාශවූ / අලාභ හානි වූ නිවාස සහ දේපළ සඳහා අයිතිකරුවන් හට ආධාර සැපයීම.

**(ඇ).** විනාශ වූ /අලාභ හානි වූ නිවාස සහ දේපළවල පදිංචිව සිටි කුලී නිවැසියන්ට සහන සැලැසීම.

**(ඈ).** විනාශයට පත් ගොඩනැගිලි ආදිය කඩාදැමීමට හා සුන්බුන් ඉවත් කිරීමට නියෝග කිරීම.

**(ඉ).** අලාභහානි වූ කර්මාන්ත හෝ වාණිජමය දේපළ වෙනුවෙන් ආධාර සැපයීම.

**(ඊ).** විනාශ වූ / අලාභ හානි වූ දේපළ රජයට පවරා ගැනීම.

**(උ).** රජයට පවරාගෙන ඇති දේපළ නියමිත හිමිකරුවන්ට ආපසු පවරාදීම.

**(ඌ).** රජයට පවරාගෙන ඇති දේපළවලට සම්බන්ධ අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පැන නගින ආරවුල් නිරවුල් කිරීම.

## (ආ).වෙනත් කාර්යයන්

(අ). ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිවාසාධාර ලබාදීම, නැවත පදිංචි කිරීමේ දීමනා සම්බන්ධීකරණය සහ පසුවිපරම කිරීම.

(ආ). ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපළ විනාශවීම හෝ ඒවාට අලාභහානි සිදුවීම වෙනුවෙන් වන්දි ගෙවීම.

(ඇ). ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වීම / තුවාල සිදුවීම / දේපළ හානි සිදු වීම වෙනුවෙන් වන්දි ගෙවීම.

(ඈ). විනාශ වූ / අලාභහානි වූ පූජනීය ස්ථාන පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර සැපයීම.

(ඉ). විවාහ සමෘද්ධි දීමනා යෝජනා ක්‍රමය යටතේ ආධාර ගෙවීම.

(ඊ). මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විපතට පත් පුද්ගලයින්ට වන්දි ගෙවීම.

(උ). නිවාස, ව්‍යාපාර හා කර්මාන්ත පුනරුත්ථාපනය සඳහා ණය පහසුකම් සැපයීම.

(ඌ). හානි වූ පුද්ගලයින් / වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(එ). යුද්ධයේ බලපෑමෙන් අසරණභාවයට පත් වූ පාසල් යන වයසේ දරුවන්ට ආධාර ලබාදීම.

(ඒ). ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(ඔ). නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

## (ඇ).ක්‍රියාකාරකම් විස්තර කිරීම.

### 1. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය.

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය විසින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් අවතැන් වූ තැනැත්තන් නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සඳහා ආධාර ප්‍රදානය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන හඳුන්වන්නේ **"ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය"** යනුවෙනි. මෙම යෝජනා ක්‍රමය හදිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ 1983 වර්ෂයේ දී සකස් කරන ලද අතර, සපයන ආධාර වැඩි කිරීම සඳහා 1994 සහ 2002 වර්ෂවලදී දෙවරක්ම අදාළ වෙනස්කම් සිදුකරන ලදී. 2003.03.06 දින සිට මේ යටතේ ලබාදෙන නිවාසධාර මුදල් රු.100,000.00 දක්වා වැඩිකර ඇත.

**<u>ස්ථිර නිවාසාධාර රු.100,000.00</u>**

පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව ඉහත ආධාර මුදල රු.50,000.00 බැගින් වාරික දෙකකින් අවතැන්වූවන්ගේ විනාශ වූ නිවාස නැවත ඉදිකර ගැනීම සඳහා ලබාදෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පවුල් 427 ක් වෙනුවෙන් රු.20,000,000.00 ක මුදලක් ගෙවන ලදී. මෙම සියළු පවුල් ප්‍රධාන වශයෙන් තෝරා ගැනෙනුයේ උතුරු නැගෙනහිර පළාත් වලිනි.

## 2. වන්දි / මූල්‍යමය ආධාර

### 2.1 මරණ හා තුවාල වෙනුවෙන් වන්දි ගෙවීම.

**(අ). රජයේ සේවක වන්දි.**

**(i) මරණ වන්දි.**

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා / කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය / සංස්ථා / සමූපකාර / අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ මරණයකදී ඔහුගේ යැපෙන්නන්ට රු:200,000.00 උපරිමයකට යටත්ව වන්දි ගෙවනු ලැබේ.මෙය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 , 59/89 හා ඊට සංශෝධිත චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල මියගිය පුද්ගලයින් 50 දෙනෙකු වෙනුවෙන් රු:6,250,000.00 ක මුදලක් ගෙවීම් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 01. | යාපනය | 08 | 1,150,000.00 |
| 02. | කිලිනොච්චිය | 10 | 1,275,000.00 |
| 03. | මුලතිව් | 13 | 1,475,000.00 |
| 04. | මන්නාරම | 04 | 425,000.00 |
| 05. | වවුනියාව | 05 | 700,000.00 |
| 06. | මඩකලපුව | 04 | 425,000.00 |
| 07. | අම්පාර | 03 | 450,000.00 |
| 08. | ත්‍රිකුණාමලය | 02 | 300,000.00 |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | 01 | 50,000.00 |
| | **එකතුව** | **50** | **6,250,000.00** |

## (ii) තුවාල වන්දි.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා / කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය / සංස්ථා / සමූපකාර / අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හට සිදුවූ තුවාල සඳහා රු:100,000.00 උපරිමයකට යටත්ව වන්දි ගෙවනු ලබයි. උපරිම වන්දි මුදල, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත්කරනු ලබන වෛද්‍ය මණ්ඩල වාර්තාවට අනුව ඉපැයීමේ හැකියාව හීනවූ ප්‍රතිශතය පදනම් කර ගනිමින් තීරණය කරනු ලැබේ.

මෙය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 , 59/89 හා ඊට සංශෝධිත චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල තුවාල ලත් පුද්ගලයින් 08 දෙනෙකු වෙනුවෙන් රු: 500,000.00 ක මුදලක් පහත පරිදි ගෙවීම් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 01. | යාපනය | 02 | 150,000.00 |
| 02. | කිලිනොච්චිය | 03 | 150,000.00 |
| 03. | මුලතිව් | 01 | 100,000.00 |
| 04. | මන්නාරම | 01 | 50,000.00 |
| 05. | වවුනියාව | 01 | 50,000.00 |
| 06. | මඩකලපුව | - | - |
| 07. | අම්පාර | - | - |
| 08. | ත්‍රිකුණාමලය | - | - |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | - | - |
| | **එකතුව** | **08** | **500,000.00** |

## (ආ). විශේෂ ශ්‍රේණියේ පුද්ගල වන්දි.

## (i) මරණ වන්දි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතු කොටගෙන ඇමතිවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ, ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පවත්වන ලද මැතිවරණයක දී තේරීපත් නොවූ අපේක්ෂකයන්ගේ මරණයකදී ඔවුන්ගේ ආසන්නතම ඥාතීන්ට උපරිමය රු.500,000.00 ක යටත්ව උපරිම වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

### (iii) තුවාල වන්දි.

ඉහත සඳහන් විශේෂ ශ්‍රේණියේ පුද්ගලයින්ට තුවාල සිදුවූ අවස්ථාවක දී රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වාර්තාවට අනුව උපරිමය රු:500,000.00 ක වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

### (ඇ). <u>බලවත්සේ විපතට පත්වූවන් සඳහා වූ වන්දි ක්‍රමය.</u>

ත්‍රස්තවාදී ක්‍රියා, ජනවාර්ගික ගැටුම්, මහජන කැළඹීම් සහ සම්බන්ධිත ආරක්ෂක මෙහෙයුම් හේතුකොට මියගිය තැනැත්තන්ගේ යැපෙන්නන් හට හෝ ඒ හේතුවෙන් තුවාල ලැබූවන්ට හෝ මෙම වන්දි ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වන්දි ලැබීමට හිමිකම් තිබේ.

- ✷ මරණයකදී රු.100,000.00
- ✷ තුවාල සිදුවීමකදී උපරිම මුදල රු. 50,000.00

( මෙම මුදල වෛද්‍ය සහතිකයේ සඳහන් දුබලතාවයේ ප්‍රතිශතය මත තීරණය වේ.)

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල මෙම වන්දි යෝජනා ක්‍රමය යටතේ මියගිය හා තුවාල ලත් පුද්ගලයින් 1031 දෙනෙකු වෙනුවෙන් රු:88,364,000.00 ක මුදලක් පහත පරිදි ගෙවීම් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මරණ | | තුවාල | |
|---|---|---|---|---|---|
| | | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
| 01. | වවුනියාව | 92 | 9,200,000.00 | 05 | 175,000.00 |
| 02. | කිලිනොච්චිය | 168 | 16,800,000.00 | 52 | 1,775,000.00 |
| 03. | යාපනය | 166 | 16,600,000.00 | 48 | 1,615,000.00 |
| 04. | මන්නාරම | 62 | 6,200,000.00 | 13 | 275,000.00 |
| 05. | මුලතිව් | 135 | 13,500,000.00 | 44 | 1,470,000.00 |
| 06. | මඩකලපුව | 90 | 8,725,000.00 | 27 | 567,500.00 |
| 07. | අම්පාර | 26 | 2,600,000.00 | 03 | 42,500.00 |
| 08. | ත්‍රිකුණාමලය | 60 | 6,000,000.00 | 14 | 314,000.00 |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | 25 | 2,500,000.00 | 01 | 5,000.00 |
| | **එකතුව** | **824** | **82,125,000.00** | **207** | **6,239,000.00** |

## 2.2 හානි වූ / විනාශ වූ පෞද්ගලික දේපළවෙනුවෙන් වන්දි ගෙවීම.

### (අ). රජයේ/ රාජ්‍ය සංස්ථා සේවකයින්ට වන්දි ගෙවීම.

1987ජුලි / අගෝස්තු මාස වලදී සහ ඉන්පසුව ඇති වූ ත්‍රස්තවාදී විපත් වලින් හානි වූ දේපළ වෙනුවෙන් රු.150,000.00 ක උපරිමය දක්වා වන්දි මුදලක් ලැබීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 49/89 යටතේ රජයේ සේවකයන්ට / සංස්ථා සේවකයන්ට හිමිකම් තිබේ.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 420 වෙනුවෙන් රු. 41,761,600.00 ක මුදලක් ගෙවන ලදී.

### (ආ). විශේෂ පුද්ගලයන්ට වන්දි ගෙවීම.

ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට,පළාත් සභා ඇමතිවරුන්ට හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු, පළාත් සභා පළාත් පාලන මැතිවරණ වලදී තේරීපත් නොවූ අපේක්ෂකයන්ට අයත් අලාභ හානි වූ / විනාශයට පත්වූ දේපළ වෙනුවෙන් පිළිවෙලින් රු.500,000.00 සහරු.150,000.00ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට මෙමඟින් ප්‍රතිපාදන සලසා ඇත.

2013 වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයින් 04 ක් වෙනුවෙන් රු.487,500.00 ක මුදලක් ගෙවන ලදී.

### (ඇ). සාමාන්‍ය මහජනයා සඳහා වන්දි ගෙවීම.

ඉහත සඳහන් යෝජනා ක්‍රම දෙක යටතේ ආධාර ලැබීමට හිමිකම් නොමැති විපතට පත් පුද්ගලයන්ට හා ඔවුන්ගේ හානි වූ / විනාශ වූ වාහන ද ඇතුළුව, දේපළ වෙනුවෙන් අලාභයෙන් 20%ක මුදලක් උපරිමය රු.100,000.00 කට යටත්ව ගෙවීම් කරනු ලැබේ.

මෙම වන්දි යෝජනා ක්‍රමය 1983 ජූලි මාසයේ සිට ආවරණය වන පරිදි 1996.02.16 වැනි දින සිට ක්‍රියාත්මක කෙරේ.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 620 දෙනෙකුට වන්දි වශයෙන් රු. 40,957,085.00 ක මුදලක් ගෙවන ලදී.

## 2.3 හානියට පත් පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණ කිරීම.

ත්‍රස්තවාදී ක්‍රියා නිසා අලාභහානි වූ / විනාශයට පත් වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආධාර දෙනු ලැබේ. මුළුමනින්ම විනාශ වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපරිමය රු.1,000,000.00ක් ද, කොටසක් විනාශ වූ ස්ථාන සඳහා උපරිමය රු.500,000.00ක් ද ගෙවීම් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පූජනීය ස්ථාන 116ක් සඳහා වන්දි වශයෙන් රු. 9,874,064.00 ක මුදලක් ගෙවන ලදී.

## 3. විවාහ සමෘද්ධි දීමනා.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් රජයේ සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන අතරතුර දී විවාහපත් වන පුද්ගලයෙකුට රු.12,500.00ක ආධාර මුදලක් ලැබීමට හිමිකම් තිබේ. සුළු පරිමාණයේ ආදායම් උපදවන ආර්ථික කටයුතු ඇරඹීමට යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ඉහත ආධාර සපයනු ලැබේ. විවාහපත් වන යුවල රජය විසින් නඩත්තු කරන ලබන සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන තැනැත්තන් වේ නම් එම ආධාර මුදල දෙගුණ වී ඔවුන්ට රු.25,000.00ක මුදලක් ගෙවනු ලැබේ.

මෙම යෝජනා ක්‍රමය 1995 වර්ෂයේ ජූලි මාසයේ දී හඳුන්වා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

## 4. පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමය.

### (i) කර්මාන්ත ණය.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් හානියට පත් ලියාපදිංචි කර්මාන්ත නැවත ආරම්භ කිරීම සඳහා 9% ක පොළි අනුපාතයක් සහ ආපසු අයකර ගැනීමේ කාලය අවුරුදු 10 කට යටත්ව එක් කර්මාන්තයකට රුපියල් මිලියන 05ක උපරිමයකට යටත්ව ණය මුදලක් ගෙවනු ලැබේ. ණය මුදල් ගෙවීම සහ ආපසු අයකර ගැනීම ලංකා බැංකුව විසින් සිදු කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ එක් කර්මාන්තයක් සඳහා රු.4,000,000.00 ක මුදලක් ගෙවන ලදී.

## (ii) ස්වයං රැකියා ණය ක්‍රමය.



පලෙල, පුලොප්ල්ලායිපදිංචි විජයරාණි පර්රාජසිංහම් මහතා පවත්වාගෙන යන ගරාජය.




පලෙල, තම්බගාමම් පදිංචි යෝගේෂ්වරී ගෝවසීකන් මහත්මිය පවත්වාගෙන යන ඇඳුම් මැසීමේ ව්‍යාපාරය.



මුලතිව්, අලම්පලි, දූප්පුවේලී පදිංචි ලයියාකුට්ටි ජගතීස්වරී මහත්මිය පවත්වාගෙන යන වෙළඳ සැල.



යාපනය, කරෙරයිනගර්, තාහම්මන් කෝවිල්ලඩි පදිංචි සින්නයියා ආනදූරසා මහතා කුඩා කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යන දත් බෙහෙත් ව්‍යාපාරය .

ත්‍රස්තවාදී ක්‍රියා / යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් හා යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් සඳහා ආධාර සැපයීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමයට 2010 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.මේ සඳහා 4% ක සහනදායී පොළී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10ක උපරිමයට හා එක් වසරක ණය සහන කාලයකට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකුට ලබා ගත හැකි උපරිම ණය මුදල රු.250,000.00 කි. මෙම ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනු ලබන්නේ උතුරු නැගෙනහිර පළාත් සඳහාය.

සමාලෝචිත වර්ෂය තුල දී පහත සඳහන් පරිදි ණය නිදහස් කර තිබුණි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 01. | වවුනියාව | 44 | 5,600,000.00 |
| 02. | මන්නාරම | 12 | 2,450,000.00 |
| 03. | කිලිනොච්චිය | 13 | 1,800,000.00 |
| 04. | මුලතිව් | 20 | 2,215,000.00 |
| 05. | යාපනය | 45 | 5,668,000.00 |
| 06. | මඩකලපුව | 60 | 9,118,000.00 |
| 07. | ත්‍රිකුණාමලය | 30 | 4,220,000.00 |
| 08. | අම්පාර | 96 | 4,175,000.00 |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | 02 | 450,000.00 |
| | **එකතුව** | **322** | **35,696,000.00** |

**(iii) නිවාස ණය ක්‍රමය.**

ත්‍රස්තවාදී ක්‍රියා / යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ නිවාස වැඩිදියුණු කරගැනීමට ආධාර සැපයීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමයට 2010වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.මේසඳහා 4% ක සහනදායී පොළී අනුපාතිකයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10ක උපරිමයකට හා එක් වසරක ණය සහන කාලයක ට යටත්ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකුට ලබා ගත හැකි උපරිම ණය මුදල රු.250,000.00කි.

2013 වර්ෂය තුලදී මෙම නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 14 දෙනෙකු වෙනුවෙන් රු.3,300,000.00 ක මුදලක් නිවාස ණය වශයෙන් පහත පරිදි නිදහස් කර තිබුණි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 01. | යාපනය | 02 | 450,000.00 |
| 02. | කිලිනොච්චිය | 01 | 250,000.00 |
| 03. | මුලතිව් | 03 | 600,000.00 |
| 04. | වවුනියාව | - | - |
| 05. | මන්නාරම | 01 | 250,000.00 |
| 06. | අම්පාර | 01 | 250,000.00 |
| 07. | ත්‍රිකුණාමලය | 01 | 250,000.00 |
| 08. | මඩකලපුව | 03 | 750,000.00 |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | 02 | 500,000.00 |
| | **එකතුව** | **14** | **3,300,000.00** |

**(iv) පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය ක්‍රමය.**

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ස්වයං රැකියා සහන ණය යෝජනා ක්‍රමය2012.01.31 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල අතර එය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 2012.04.25 දිනැති චක්‍රලේඛය මගින් පහත සහනයන් හිමි වන පරිදි නිකුත් කරන ලදී.

i. අනුමත කළ හැකි උපරිම මුදල රු.250,000.00 කි.
ii. වාර්ෂික පොළිය 4% කි.
iii. වසරක සහන කාලයකි.
iv. අය කර ගැනීමේ කාලය වසර 10 කි.

මෙම ණය ක්‍රමය පුනරුත්ථාපන අධිකාරිය හා පහත මූල්‍ය ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ.

i. ලංකා බැංකුව
ii. මහජන බැංකුව
iii. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

2013 වර්ෂය තුලදී පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ස්වයං රැකියා සහන ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 687 දෙනෙකු වෙනුවෙන් රු.119,635,000.00 ක මුදලක් ස්වයං ණය වශයෙන් පහත පරිදි ප්‍රදානය කර තිබුණි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 01. | යාපනය | 72 | 12,086,000.00 |
| 02. | කිලිනොච්චිය | 87 | 13,589,000.00 |
| 03. | මුලතිව් | 158 | 29,725,000.00 |
| 04. | වවුනියාව | 137 | 21,850,000.00 |
| 05. | මන්නාරම | 107 | 20,125,000.00 |
| 06. | මඩකලපුව | 55 | 8,035,000.00 |
| 07. | ත්‍රිකුණාමලය | 61 | 12,300,000.00 |
| 08. | අම්පාර | 06 | 1,000,000.00 |
| 09. | අනෙකුත් දිස්ත්‍රික්ක | 04 | 925,000.00 |
| | **එකතුව** | **687** | **119,635,000.00** |



වවුනියාව, නැඩුන්කර්ණි, ඔලුමඩුවෙහි පදිංචි එම්.සුබ්‍රමනියම් මහතා කෘෂි කර්මාන්තයේ නිරත වීම.



වවුනියාව, නැඩුන්කර්ණි, ඔලුමඩුවෙහි පදිංචි ජෙයබාලසිංහම් යෝගරානි මහත්මිය එළවළු වගාවේ නිරත වීම.



කිලිනොච්චි, තිරුනගර් දකුණ, අංක.430 හි පදිංචි වී.දයාහරන් මහතා පවත්වාගෙන යන ශබ්ද විකාශන යන්ත්‍ර කුලී දීමේ ව්‍යාපාරය.



යාපනය, අලවෙට්ටි දකුණ, තඩුවාන් තිරුක්කුරම් පදිංචි කේ.තිරුක්කුමාර් මහතා පවත්වාගෙන යන කුඩා ව්‍යාපාරය ව්‍යාපාරය.

## පුනරුත්ථාපන අධිකාරිය විසින් අරඹා ඇති නව ව්‍යාපෘති.

### 01. අන්තර් අමාත්‍යාංශ වැඩසටහන යටතේ ගම්මාන පුනරුත්ථාපනය.

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාගේ සංකල්පයකට අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සහභාගීත්වයෙන් මෙම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙහිදී ඌණ සංවර්ධිත දුෂ්කර ගම්මාන තෝරා ගනු ලබන අතර, එකී ජනතාවගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් වැඩි දියුණු කිරීම සඳහා පුනරුත්ථාපන අධිකාරිය විසින් මූලික කටයුතු සම්පාදනය කරනු ලබන අතර අනෙකුත් සංවර්ධන කාර්යයන් හා යටිතල පහසුකම් සඳහා එක් එක් අමාත්‍යාංශයන්ගේ සහ දෙපාර්තමේන්තුවල සහයෝගීතාවය අපේක්ෂා කරනු ලබයි.

- යුද්ධයෙන් අර්ධ වශයෙන් විනාශයට පත් වූ නිවාස නැවත ඉදිකරගැනීම සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ පරනාට්ටකණ්ඩාල් ග්‍රාමයෙහි නිවාස 80ක් ඉදිකිරීම සඳහා රු:3,975,000.00/= ක මුදලක් ප්‍රදානය කරන ලදී. එමෙන්ම එහි කතෝලික දේවස්ථානය සහ හින්දු කෝවිල ඉදිකිරීම සඳහා ලක්ෂ 2 ක මුදලක් වැය කරන ලදී.

- යුද්ධයෙන් අර්ධ වශයෙන් විනාශයට පත් වූ නිවාස නැවත ඉදිකරගැනීම සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය සමගිපුර ග්‍රාමයෙහි නිවාස 96ක් ඉදිකිරීම සඳහා රු:4,800,000.00/= ක මුදලක් ප්‍රදානය කල අතර එහි බෞද්ධ විහාරස්ථානය ඉදිකිරීම සඳහා ලක්ෂ 10ක මුදලක් වැය කරන ලදී.

- යුද්ධයෙන් අර්ධ වශයෙන් විනාශයට පත් වූ නිවාස නැවත ඉදිකරගැනීම සඳහා මඩකලපුව දිස්ත්‍රික්කයේ වවුනතිවු ගාන්දිනගර් ග්‍රාමයෙහි නිවාස 112ක් ඉදිකිරීම සඳහා රු:5,600,000.00/= ක මුදලක් ලබාදීම.

- යුද්ධයෙන් අර්ධ වශයෙන් විනාශයට පත් වූ නිවාස නැවත ඉදිකරගැනීම සඳහා යාපනය දිස්ත්‍රික්කයේ යාපනය බොම්මවෙලි ග්‍රාමයෙහි නිවාස 55ක් ඉදිකිරීම සඳහා රු:2,750,000.00/= ක මුදලක් ලබාදීම සිදු කරන ලදී.

පුනරුත්ථාපන අධිකාරිය.
අංක.59, ඩී.එස්.සේනානායක මාවත,
කොළඹ 08.

## රාජ්‍ය අංශ අස්තිත්වය – මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
## 2013 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **වත්කම්** | | | |
| ජංගම නො වන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 242,757,492.43 | 216,974,057.17 |
| දිගු කාලීන ආයෝජන | 2 | 868,865,242.00 | 852,502,212.63 |
| | | 1,111,622,734.43 | 1,069,476,269.80 |
| ජංගම වත්කම් | | | |
| තොගය | 3 | 442,442.03 | 377,525.31 |
| ණය අය කිරීම් | 4 | 73,437,944.56 | 73,647,007.21 |
| සේවක ණය | 5 | 13,702,815.41 | 14,349,991.18 |
| සේවක පාරිතෝෂික ආයෝජන | 6 | 5,875,222.01 | 4,832,555.00 |
| අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම් | 7 | 50,803,077.06 | 119,846,411.22 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8 | 16,728,294.32 | 34,415,934.67 |
| | | 160,989,795.39 | 247,469,424.59 |
| **මුළු වත්කම්** | | 1,272,612,529.82 | 1,316,945,694.39 |
| **බැරකම්** | | | |
| ජංගම නො වන බරකම් | | | |
| වෙන් කිරීම් සහ වෙනත් බැරකම් | 9 | 738,994,380.00 | 764,844,380.00 |
| | | 738,994,380.00 | 764,844,380.00 |
| ජංගම බැරකම් | | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 10 | 2,296,494.97 | 3,352,715.67 |
| | | 2,296,494.97 | 3,352,715.67 |
| **මුළු බැරකම්** | | 741,290,874.97 | 768,197,095.67 |
| **ශුද්ධ වත්කම්** | | 531,321,654.85 | 548,748,598.72 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | 11 | | |
| රාජ්‍ය ප්‍රදාන | | 218,996,000.00 | 198,996,000.00 |
| ප්‍රත්‍යගණනය මත අතිරික්තය | | 6,530,642.30 | 5,738,374.50 |
| සමුච්චිත අතිරික්තය | | 296,446,615.17 | 335,991,299.62 |
| විශ්‍රාම වරප්‍රසාද වගකීම | | 9,348,397.38 | 8,022,924.60 |
| **මුළු ස්කන්ධය / බැරකම්** | | 531,321,654.85 | 548,748,598.72 |

ඊ. ඒ. සමරසිංහ
( සභාපති )

එස්. එන්. සී. ඩබ්. එම්. ධර්මකීර්ති
( සහකාර අධ්‍යක්ෂ, මුදල් )

පී. එස්. විතානගේ
( ලේකම් ) පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## රාජ්‍ය අංශ අස්තිත්වය - මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රදාන | 1 | 237,029,000.00 | 86,451,000.00 |
| පොළී | 2 | 13,948,205.53 | 12,468,160.77 |
| වෙනත් ආදායම | | 17,625.00 | 14,400.00 |
| අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ / පාඩු | | (71,853.21) | - |
| **මුළු ආදායම** | | **250,922,977.32** | **98,933,560.77** |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක වරප්‍රසාද | 3 | 26,663,773.22 | 26,683,183.15 |
| ප්‍රදාන සහ වෙනත් සංක්‍රාම ගෙවීම් | 4 | 193,893,757.99 | 53,729,516.00 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 5 | 3,539,902.33 | 3,268,005.28 |
| ක්ෂයවීම් | 6 | 3,718,248.24 | 2,568,523.01 |
| ස්ථාවර වත්කම් නඩත්තුව | 7 | 2,639,710.10 | 2,125,444.51 |
| වෙනත් වියදම් | 8 | - | 11,782,979.78 |
| මූල්‍ය වියදම් | 9 | - | 58,925.00 |
| **මුළු වියදම්** | | **230,455,391.88** | **100,216,576.73** |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌණතාවය** | | **20,467,585.44** | **(1,283,015.96)** |

## තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන් | 2013 ( රු. ) |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් | | 237,029,000.00 |
| විවිධ ආදායම් | | 64,500.00 |
| අධිභාර | | 1,286,609.92 |
| වෙනත් පුනරාවර්තන වියදම් | ඒ | (237,692,013.44) |
| ස්ථිර නිවාස ආධාර | | (20,000,000.00) |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(19,311,903.52)** |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ** | | |
| පොලී ආදායම | බී | 12,564,629.56 |
| ණය අයකර ගැනීම් | සී | 3,213,243.73 |
| ස්ථාවර වත්කම් මිල දී ගැනුම් | ඩී | (5,467,116.50) |
| උපචිත වියදම් | | (966,157.17) |
| කල් පිරුණු ආයෝජන ආපසු ගැනීම් | | 139,125,970.63 |
| ආයෝජන | ඊ | (166,846,307.08) |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(18,375,736.83)** |
| **මූලනමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | **20,000,000.00** |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | 20,000,000.00 |
| **මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ වැඩිවීම / අඩුවීම** | | **(17,687,640.35)** |
| **කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ** | එෆ් | **34,415,934.67** |
| **කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ** | ජී | **16,728,294.32** |

* *ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.*

* *වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.*

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

| 2012 (රු.) | සටහන් | | 2013 (රු.) |
|---|---|---|---|
| | | **වත්කම්** | |
| **216,974,057.17** | 1 | **දේපළ, පිරියත හා උපකරණ** | **242,757,492.43** |
| | | **පිරිවැය** | |
| 25,189,552.85 | | වර්ෂයේ ආරම්භක දිනට අගය | 26,371,050.30 |
| - | | ජර්නල් සටහන් අංක - 12 | 4,950,000.00 |
| - | | වර්ෂය තුළ අපහරණය ( අපහරණය කළ වත්කම්වල ගත් මිල ) | 1,089,939.50 |
| - | | වර්ෂය තුළ ප්‍රත්‍යගණනය ( ප්‍රත්‍යගණිත වත්කම්වල ගත් මිල ) | 13,006,880.80 |
| 1,181,497.45 | | වර්ෂය තුළ එකතු කිරීම් | 5,549,616.50 |
| - | | එකතු කළා - වත්කම්වල ප්‍රත්‍යගණිත අගය | 4,042,999.47 |
| **26,371,050.30** | | | **26,816,845.97** |
| | | **ක්ෂයවීම්** | |
| 15,341,555.12 | | වර්ෂයේ ආරම්භක දිනට අගය | 18,260,078.13 |
| - | | අපහරණය කළ වත්කම්වල ක්ෂයවීම් | 971,211.29 |
| - | | ප්‍රත්‍යගණිත වත්කම්වල ක්ෂයවීම් | 9,756,149.13 |
| 3,718,248.23 | | එකතු කළා - වර්ෂය සඳහා ක්ෂය | 3,718,248.23 |
| 350,000.00 | | ජර්නල් සටහන් අංක - 12 | 1,671,472.60 |
| - | | අඩු කළා - වර්ෂය තුළ මාරු කිරීම් | - |
| **18,260,078.13** | | වර්ෂය අවසාන අගය | **12,922,438.54** |
| | | **ශුද්ධ පොත් අගය** | |
| **8,110,972.17** | | වර්ෂය අවසාන අගය | **13,894,407.43** |
| | | *( විස්තර සඳහා සටහන් අංක. 12 - 1 බලන්න )* | |
| 208,863,085.00 | | *නිවාස ආධාර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන* | 228,863,085.00 |
| **852,502,212.63** | 2 | **දිගු කාලීන ආයෝජන** | **868,865,242.00** |
| 852,502,212.63 | | ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල් | 868,865,242.00 |
| | | *( විස්තර සඳහා සටහන් අංක. 13 - 1 බලන්න )* | |

| | | | |
|---|---|---|---|
| **377,525.31** | **3** | **තොගය** | **442,442.03** |
| 377525.31 | | තොග ( ලිපි ද්‍රව්‍ය ) | 442,442.03 |
| **73,647,007.21** | **4** | **ණය අය කිරීම්** | **73,437,944.56** |
| 4,681,213.68 | | රු. 200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය | 4,472,151.03 |
| 67,341,609.58 | | රු. 25,000.00 ලංකා බැංකු දේපළ යථාවත් කිරීමේ ණය | 67,341,609.58 |
| (6,736,352.14) | | අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | (6,736,352.14) |
| 9,289,484.54 | | රු. 10,000.00 ලංකා බැංකු ස්වයං රැකියා ණය | 9,289,484.54 |
| (928,948.45) | | අඩමාණ ණය සඳහා වෙන් කිරීම් | (928,948.45) |
| **14,349,991.18** | **5** | **සේවක ණය** | **13,702,815.41** |
| 9,277,091.74 | | දේපළ ණය | 8,722,048.26 |
| 4,938,404.53 | | ආපදා ණය ( දැසමස වැටුප් ණය ) | 4,880,524.70 |
| 45,494.91 | | ගංවතුර අත්තිකාරම් | - |
| 89,000.00 | | උත්සව අත්තිකාරම් | 100,242.45 |
| **4,832,555.00** | **6** | **සේවක පාරිතෝෂික ආයෝජන** | **5,875,222.01** |
| 4,832,555.00 | | සේවක පාරිතෝෂික ආයෝජන | 5,875,222.01 |
| **119,846,411.22** | **7** | **අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම්** | **50,803,077.06** |
| 43,870,837.96 | | ණයදෙන ආයතනවලින් ලැබියයුතු පොලී | 44,911,247.51 |
| 557,348.66 | | පාරිතෝෂික ආයෝජනවලින් ලැබිය යුතු පොලී | 415,196.84 |
| 239,612.06 | | ලැබිය යුතු ලැබීම් | 208,538.56 |
| 347,921.48 | | පෙර - ගෙවුම් | 254,801.48 |
| - | | අයවිය යුතු වැටුප් | 28,292.67 |
| 910,000.00 | | ආපසු ගෙවිය යුතු තැන්පතු | 4,985,000.00 |
| 73,920,691.06 | | භාණ්ඩාගාර තැන්පතු | - |
| **34,415,934.67** | **8** | **මුදල් හා මුදල් සමාන දෑ** | **16,728,294.32** |
| 34,311,551.95 | | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක - 2026495 | 869,378.32 |
| 104,382.72 | | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක - 2026496 | 313,445.37 |
| - | | ලංකා බැංකුව - මෙට්‍රොපොලිටන් ශාඛාව ගිණුම් අංක - 74757297 | 15,545,470.63 |
| **1,316,945,694.39** | | **මුළු වත්කම්** | **1,272,612,529.82** |

| | | | |
|---|---|---|---|
| 764,844,380.00 | 9 | වෙන් කිරීම් සහ වෙනත් බැරකම් | 738,994,380.00 |
| | | ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය දීම සඳහා | |
| 738,544,380.00 | | භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ අරමුදල් | 738,544,380.00 |
| 450,000.00 | | විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 450,000.00 |
| 3,352,715.67 | 10 | වෙනත් ගෙවිය යුතු දෑ | 2,296,494.97 |
| 966,157.17 | | උපචිත වියදම් | 1,565,023.67 |
| 2,386,558.50 | | තැන්පත් ගිණුම | 731,471.30 |
| 768,197,095.67 | | මුළු බැරකම් | 741,290,874.97 |
| 548,748,598.72 | | ශුද්ධ වත්කම් | 531,321,654.85 |

# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| 2012 (රු.) | සටහන් | | 2013 (රු.) |
|---|---|---|---|
| | | **අයභාර** | |
| 86,451,000.00 | 1 | අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් සංක්‍රාම ලැබීම් | 237,029,000.00 |
| | | භාණ්ඩාගාර අරමුදල් - ප්‍රාග්ධන | |
| 86,451,000.00 | | භාණ්ඩාගාර අරමුදල් - පුනරාවර්තන | 237,029,000.00 |
| 12,468,160.77 | 2 | පොලී | 13,948,205.53 |
| | | *ණයදන ආයතනවල ආයෝජනවලින් ලද පොලී* | |
| 1,255,000.00 | | ලංකා බැංකුව | 1,247,123.29 |
| 3,500,535.63 | | මහජන බැංකුව | 1,956,978.08 |
| 377,742.23 | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | 306,181.55 |
| 75,000.00 | | හැටන් නැෂනල් බැංකුව | 24,041.10 |
| 200,000.00 | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 200,000.00 |
| 1,869,045.00 | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1,857,534.08 |
| 4,050,162.07 | | ලංකා බැංකුව - නව ණය යෝජනා ක්‍රමය | 4,856,032.44 |
| 361,151.58 | | පාරිතෝෂික ආයෝජන සඳහා පොලී | 401,241.19 |
| | | *සේවක ණය සඳහා පොලී* | |
| 532,952.14 | | දේපළ ණය | 459,844.05 |
| 244,552.52 | | ආපදා ණය | 209,091.59 |
| 2,019.60 | | විශ්‍රාම අත්තිකාරම් | 2,689.74 |
| - | | ඉතුරුම් ගිණුම | 2,427,448.42 |
| 14,400.00 | | | 17,625.00 |
| 14,400.00 | | වෙනත් අයභාර | 17,625.00 |
| - | | | (71,853.21) |
| - | | අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ / පාඩු | (71,853.21) |
| **98,933,560.77** | | **මුළු අයභාර** | **250,922,977.32** |

## වියදම්

| | | |
|---|---|---|
| **26,683,183.15** | **3 වැටුප්, වේතන හා සේවක වරප්‍රසාද** | **26,663,773.22** |
| 12,109,012.03 | කාරයය මණ්ඩල වැටුප් | 12,786,075.79 |
| 2,215,524.42 | සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් | 2,450,236.87 |
| 553,881.08 | සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් | 612,559.21 |
| 740,237.89 | අතිකාල සහ නිවාඩු දින වැටුල් | 506,141.25 |
| 3,948,262.50 | ජීවන වියදම් දීමනාව | 4,679,224.00 |
| 600,000.00 | සභාපති දීමනාව | 600,000.00 |
| 460,000.00 | ක්‍රියාකාරී අධ්‍යක්ෂ දීමනාව | 480,000.00 |
| 52,000.00 | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 80,000.00 |
| - | විගණන හා කළමනාකරණ කමිටු සාමාජික දීමනා | 64,000.00 |
| 48,000.00 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා | 48,000.00 |
| 1,592.10 | ද්විතීයන දීමනා | - |
| 1,755,807.97 | විශේෂ දීමනා | 2,202,459.65 |
| 753,769.33 | වෙනත් දීමනා | 710,932.70 |
| 95,152.80 | භාෂා දීමනා | 96,739.73 |
| 3,349,943.03 | පාරිතෝෂික දීමනා | 1,347,404.02 |
| **53,729,516.00** | **4 ප්‍රදාන සහ වෙනත් සංක්‍රාම ගෙවීම්** | **193,893,757.99** |
| | *මරණ හා තුවාල වන්දි* | |
| 3,450,000.00 | රජයේ සේවක | 6,750,000.00 |
| 23,227,500.00 | සාමාන්‍ය මහජන | 88,264,000.00 |
| | *හානියට පත් දේපළ සඳහා වන්දි* | |
| 13,448,279.00 | රජයේ සේවක | 41,761,645.00 |
| 13,378,737.00 | සාමාන්‍ය මහජන | 40,957,085.00 |
| 200,000.00 | පූජනීය ස්ථාන | 10,361,564.00 |
| 25,000.00 | විවාහ සමෘද්ධි දීමනා | - |
| - | ණය සුපරීක්ෂණ වැඩසටහන | 1,529,951.99 |
| - | ස්වයං රැකියාලාභී පුහුණු වැඩසටහන | 739,228.80 |
| - | වන්දි ප්‍රදානය කිරීමේ උත්සව කටයුතු සංවිධානය | 3,530,283.20 |
| **3,268,005.28** | **5 සැපයුම් හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය** | **3,539,902.33** |
| 952,567.72 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 1,037,592.78 |
| 2,139,809.56 | ඉන්ධන හා ලිහිසි තෙල් | 2,310,194.55 |
| 67,928.00 | නිල ඇඳුම් | 79,380.00 |
| 107,700.00 | පුවත්පත් සහ සඟරා | 112,735.00 |

| | | |
|---|---|---|
| **2,568,523.01** | **6 ක්ෂයවීම්** | **3,718,248.24** |
| 1,562,633.00 | ක්ෂය - මෝටර් වාහන | 2,787,293.84 |
| 270,548.66 | ක්ෂය - ලී බඩු, කාර්යාල උපකරණ හා සවි කිරීම් | 141,400.09 |
| 116,196.00 | ක්ෂය - කාමර වෙන් කිරීම් | 116,196.00 |
| 36,170.84 | ක්ෂය - දුරකථන | 5,632.30 |
| 193,228.00 | ක්ෂය - යන්ත්‍ර සහ පිරියත | 198,676.55 |
| 312,134.90 | ක්ෂය - පරිගණක | 258,290.58 |
| 77,611.61 | ක්ෂය - වායු සමීකරණ | 210,758.88 |
| **2,125,444.51** | **7 ස්ථාවර වත්කම් නඩත්තුව** | **2,639,710.10** |
| 488,130.04 | ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 900,804.33 |
| 1,637,314.47 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 1,682,406.77 |
| - | ගොඩනැගිල්ල නඩත්තු වියදම් | 56,499.00 |
| **11,782,979.78** | **8 වෙනත් වියදම්** | **12,832,277.70** |
| 180,999.50 | ගමන් වියදම් - දේශීය | 195,462.68 |
| - | ගමන් වියදම් - විදේශීය | 53,600.00 |
| 487,634.00 | දුරකථන ගාස්තු | 475,711.31 |
| 376,297.00 | තැපැල් ගාස්තු | 465,903.00 |
| 1,001,268.48 | විදුලිය බලය සහ අනෙකුත් පහසුකම් | 1,002,031.96 |
| 5,100,000.00 | ගොඩනැගිලි කුලිය | 5,528,400.00 |
| 1,114,731.60 | වාහන කුලී | 1,170,000.00 |
| 594,892.80 | මුද්‍රණ හා ප්‍රචාරණ ගාස්තු | 731,836.00 |
| 1,137,042.95 | සංග්‍රහ වියදම් | 205,761.41 |
| 150,000.00 | විගණන ගාස්තු | 150,000.00 |
| 145,134.50 | සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම් | 151,500.00 |
| 447,176.40 | සේවකයින් සඳහා වෛද්‍ය රක්ෂණ | 434,612.04 |
| 997,901.75 | විවිධ වියදම් | 1,019,615.93 |
| 49,900.80 | සුභ සාධක වියදම් | 320,404.45 |
| - | ජංගම හා දැනුවත් කිරීමේ වැඩසටහන | 602,438.92 |
| - | නීති ගාස්තු | 325,000.00 |
| **58,925.00** | **9 මූල්‍ය වියදම්** | **216,980.58** |
| - | බැංකු ගාස්තු - 10 % වැට් බදු | 216,980.58 |
| 20,000.00 | ආයෝජන පොළී මත රඳවා ගැනීමේ බදු | |
| 38,925.00 | ජාතික සංවර්ධන බැංකු සඳහා පොළී | |
| **100,216,576.73** | **මුළු වියදම** | **243,504,650.16** |
| **(1,283,015.96)** | **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / උනතාවය** | **7,418,327.16** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

| | | 2013 ( රු. ) |
|---|---|---|
| **ඒ** | **වෙනත් පුනරාවර්තන වියදම්** | **(237,692,013.44)** |
| | පෞද්ගලික පඩිනඩි | (25,359,981.33) |
| | ගමන් වියදම් | (507,746.00) |
| | සැපයුම් | (3,592,169.05) |
| | නඩත්තුව | (2,545,724.42) |
| | ගිවිසුම් ගත සේවා | (10,838,414.73) |
| | වෙනත් පුනරාවර්තන වියදම් | (4,449,777.12) |
| | බලවත් සේ විපතට පත්වූවන් සඳහා වන්දි | (95,114,000.00) |
| | හානියට පත් දේපළ සඳහා වන්දි | (95,284,200.79) |
| **බී** | **පොළී ආදායම** | **12,564,629.56** |
| | 2013 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද පොළී | 9,407,480.99 |
| | සේවක ණයවලින් ලද පොළී | |
| | ආපදා ණය ( දසමස ණය ) | 209,091.59 |
| | දේපළ ණය | 459,844.05 |
| | විශේෂ අත්තිකාරම් | 2,689.74 |
| | පාරිතෝෂික ආයෝජන සඳහා පොළී | 58,074.77 |
| | ඉතුරුම් ගිණුමෙන් ලද පොළී | 2,427,448.42 |
| **සී** | **ණය අයකර ගැනීම්** | **3,213,243.73** |
| | රු. 200,000 / - ලංකා බැංකු ණය | 209,062.65 |
| | උත්සව අත්තිකාරම් | 233,257.55 |
| | ආපදා ණය ( දසමස ණය ) | 1,014,104.56 |
| | දේපළ ණය | 555,043.48 |
| | විශේෂ අත්තිකාරම් | 75,000.00 |
| | ගංවතුර අත්තිකාරම් | 45,495.18 |
| | විවිධ තැන්පතු | 872,180.16 |
| | ලැබිය යුතු ලැබීම් | 188,283.63 |
| | පෙර වර්ෂවල ආදායම | 20,816.52 |

| | |
|---|---|
| **ඩී ස්ථාවර වත්කම් මිල දී ගැනුම්** | **(5,467,116.50)** |
| ලී බඩු, කාර්යාල උපකරණ හා සවි කිරීම් | (1,595,408.50) |
| දුරකථන | (120,150.00) |
| පරිගණක | (1,106,250.00) |
| වායු සමීකරණ | (953,128.00) |
| කාමර වෙන් කිරීම් | (1,692,180.00) |
| **ඊ ආයෝජන** | **(166,846,307.08)** |
| පාරිතෝෂික ආයෝජන | (557,348.77) |
| උත්සව අත්තිකාරම් | (245,000.00) |
| ආපදා ණය ( දසමස ණය ) | (956,225.00) |
| විශේෂ අත්තිකාරම් | (75,000.00) |
| විවිධ තැන්පතු | (2,527,267.36) |
| පෙර ගෙවුම් | (254,801.48) |
| ආපසු ලැබිය යුතු තැන්පතු | (4,500,000.00) |
| පෙර වර්ෂවල වියදම | (2,241,664.47) |
| ලංකා බැංකු කර්මාන්ත ණය යෝජනා ක්‍රමය | (10,000,000.00) |
| ලංකා බැංකු නව ණය යෝජනා ක්‍රමය | (145,489,000.00) |
| **එෆ් කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ** | **34,415,934.67** |
| ලංකා බැංකුව - ජංගම ගිණුම අංක. 02026495 | 34,311,551.95 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම අංක. 02026496 | 104,382.72 |
| ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම අංක. 74757297 | |
| **ජී කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ** | **16,728,294.32** |
| ලංකා බැංකුව - ජංගම ගිණුම අංක. 02026495 | 869,378.32 |
| ලංකා බැංකුව - ජංගම ගිණුම අංක. 02026496 | 313,445.37 |
| ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම අංක. 74757297 | 15,545,470.63 |

## රාජ්‍ය අංශ අස්තිත්වය - ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන් - 11

| | සමුච්ත අරමුදල | පාරිතෝෂික වෙන්කිරීම් | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 335,991,299.62 | 8,022,924.60 | 198,996,000.00 | 5,738,374.50 | 548,748,598.72 |
| | | | | | |
| දේපළ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | | | | 792,267.80 | 792,267.80 |
| වර්ෂයට අදාළ වෙන් කිරීම් ( ශුද්ධ ) | | 1,325,472.78 | 20,000,000.00 | | 21,325,472.78 |
| පෙර වර්ෂවල වියදම | (51,933,828.13) | | | | (51,933,828.13) |
| පෙර වර්ෂවල ආදායම | 4,970,816.52 | | | | 4,970,816.52 |
| කාලච්ඡේදය සඳහා වූ අතිරික්තය / ඌනතාවය | 7,418,327.16 | | | | 7,418,327.16 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 296,446,615.17 | 9,348,397.38 | 218,996,000.00 | 6,530,642.30 | 531,321,654.85 |

2013

| සටහන් අංක .12-1 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | |
| | මෝටර් වාහන | ලී බඩු, කාර්යාල උපකරණ සහ සවි කිරීම් | යන්ත්‍ර හා පිරියත | දුරකථන | කාමර වෙන් කිරීම් | පරිගණක | වායු සමීකරණ | එකතුව |
| *පිරිවැය* | | | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 10,751,570.00 | 6,488,962.37 | 1,560,224.50 | 868,631.51 | 1,522,660.00 | 2,133,781.59 | 3,045,220.33 | 26,371,050.30 |
| *ජර්නල් සටහන් අංක. 12* | 4,950,000.00 | | - | | | | | 4,950,000.00 |
| වර්ෂය තුළ අපහරණය | - | 304,229.50 | 14,175.00 | 7,660.00 | - | 471,675.00 | 292,200.00 | 1,089,939.50 |
| ප්‍රත්‍යාගණිත වත්කම්වල ගත් මිල | - | 6,184,732.87 | 1,546,049.50 | 860,971.51 | - | 1,662,106.59 | 2,753,020.33 | 13,006,880.80 |
| ප්‍රත්‍යාගණිත වත්කම්වල අගය | - | 1,405,618.77 | 794,706.20 | 56,323.00 | - | 943,316.00 | 843,035.50 | 4,042,999.47 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 1,595,408.50 | - | 120,150.00 | 1,692,180.00 | 1,188,750.00 | 953,128.00 | 5,549,616.50 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 15,701,570.00 | 3,001,027.27 | 794,706.20 | 176,473.00 | 3,214,840.00 | 2,132,066.00 | 1,796,163.50 | 26,816,845.97 |
| *ක්ෂය කිරීම්* | | | | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 6,471,949.09 | 4,779,844.00 | 1,254,529.08 | 745,528.56 | 1,060,768.62 | 1,494,053.34 | 2,453,405.44 | 18,260,078.13 |
| අපහරණය කළ වත්කම්වල ක්ෂය අගය | - | 203,640.10 | 14,175.00 | 5,109.68 | - | 456,086.51 | 292,200.00 | 971,211.29 |
| | 6,471,949.09 | 4,576,203.90 | 1,240,354.08 | 740,418.88 | 1,060,768.62 | 1,037,966.83 | 2,161,205.44 | 17,288,866.84 |
| ප්‍රත්‍යාගණිත වත්කම්වල ක්ෂය අගය | - | 4,576,203.90 | 1,240,354.08 | 740,418.88 | - | 1,037,966.83 | 2,161,205.44 | 9,756,149.13 |
| *ජර්නල් සටහන් අංක. 13* | 1,671,472.60 | | | | | | | 1,671,472.60 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 2,787,293.84 | 141,400.09 | 198,676.55 | 5,632.30 | 116,196.00 | 258,290.58 | 210,758.88 | 3,718,248.23 |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | - | - | - | - | - | - | - |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,930,715.53 | 141,400.09 | 198,676.55 | 5,632.30 | 1,176,964.62 | 258,290.58 | 210,758.88 | 12,922,438.54 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | 4,770,854.47 | 2,859,627.18 | 596,029.65 | 170,840.70 | 2,037,875.38 | 1,873,775.42 | 1,585,404.63 | 13,894,407.43 |

සටහන් අංක.13 -1

2013 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල්

| ආයතනය | ලෙජර් පිටු අංක | නිවාස ණය | ව්‍යාපාරික ණය | කර්මාන්ත ණය | ස්වයං රැකියා ණය | නව නිවාස ණය | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 38, 50 | 9,500,000.00 | 2,500,000.00 | 31,000,000.00 | 537,987,000.00 | 70,991,000.00 | 651,978,000.00 |
| මහජන බැංකුව | 41 | 67,200,000.00 | | | | | 67,200,000.00 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 49 | 123,213,000.00 | | | | | 123,213,000.00 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | 47 | 16,474,242.00 | | | | | 16,474,242.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 45 | 10,000,000.00 | | | | | 10,000,000.00 |
| එකතුව | | 226,387,242.00 | 2,500,000.00 | 31,000,000.00 | 537,987,000.00 | 70,991,000.00 | 868,865,242.00 |

සටහන් අංක.13 -2

2013 දෙසැම්බර් 31 දිනට ණයදෙන ආයතනවලින් ලැබිය යුතු පොළී

| ආයතනය | ලෙජර් පිටු අංක | ගණන රු. |
|---|---|---|
| ලංකා බැංකුව | 22 | 1,247,123.29 |
| මහජන බැංකුව | 24 | 1,956,978.08 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 33 | 36,366,579.08 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | 31 | 306,263.74 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 28 | 178,270.84 |
| ලංකා බැංකු නව ණය ක්‍රමය | 36 | 4,856,032.48 |
| එකතුව | | 44,911,247.51 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. JP/A/REPPIA/1/13/33 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2014 දෙසැම්බර් 18 දින

සභාපති,

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

**තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනතේ 8(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමානය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආකෘතියට අනුව ජංගම වත්කම් සහ ජංගම නොවන වත්කම්, ජංගම බැරකම් සහ ජංගම නොවන බැරකම් යන අනු පිළිවෙලට ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම අනුපිළිවලින් දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ ගිණුම් සමඟ දක්වා ඇති පෙර වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා වෙනස්කම් සිදුකර තිබුණද ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කෙරෙන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී සමස්ත වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කරනවා වෙනුවට තෝරා ගත් වත්කම් කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කරන ලදි. ඒ අනුව ප්‍රත්‍යාගණනය නොකළ රු.8,138,908 ක වත්කම් ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

(ආ). අධිකාරිය සමාලෝචිත වර්ෂයට පෙර පැවති කුළී ගොඩනැගිල්ලක කාමර වෙන්කිරීම සඳහා දරන ලද අයභාර ස්වරූපයේ රු.1,522,660 ක මුදලක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනය වනවිට අධිකාරියේ කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන ගොස් තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| xiv පරිච්ඡේදයේ 1.3 වගන්තිය. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව රු.460,863 ක් අධිකාරියේ නිළධාරීන් සඳහා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේ උපරිම සීමාව රු.20,000 ක් වුවත් ඊට පටහැනිව අවස්ථා 35 කදී රු.20,000 සිට රු.207,500 දක්වා වූ පරාසයක අත්තිකාරම් නිකුත් කර තිබුණි. තවද එක් අත්තිකාරමක් නිරවුල් කිරීමට පෙර තවත් අත්තිකාරමක් ලබාදී තිබුණි. |
| (ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන වගන්තිය | කාර්ය මණ්ඩල විවිධ ශ්‍රේණිවලට රාජකාරි සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.86,857 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරීන්ට ආපදා ණය ලබාදීමේදී උපරිම සීමාව රු.250,000 ක් වුවද අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට එම සීමාව ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි. |
| (ඊ) 2011 සැප්තැම්බර් 12 දිනැති අංක 43(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | වැටුප් පරිවර්තන කිරීමේදී යම් නිලධාරියෙකු ලබමින් සිටි වැටුප අඩුවීමක් සිදුවූයේ නම් එය ඉවත් කිරීම සඳහා ලබාදුන් ගැලපීමේ දීමනාව 2011 ජූලි 01 දින සිට සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු වුවද එසේ සිදු නොකොට නිලධාරීන් තිදෙනෙකුට දිගටම ගෙවීම් කර තිබුණි. |

## 2.4 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

වර්ෂය තුළදී ගෙවීම් කරන ලද වන්දි මුදල් මූල්‍ය ප්‍රකාශන අනුව රු.98,625,564 ක් ලෙස දක්වා තිබූ නමුත් වන්දි අංශය විසින් පවත්වාගෙන යන ලේඛනවලට අනුව රු.96,238,064 ක් වූයෙන් රු.587,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.5 ලැබිය යුතු ගිණුම්

------------------

2009 වර්ෂයේ අනතුරට පත්වූ වාහනයක් වෙනුවෙන් රක්ෂණ ආයතනයකින් ලැබියයුතු රු.44,300 ක වන්දි අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

## 2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

කුළී පදනම මත නව කාර්යාල ගොඩනැගිල්ලක් ලබාගැනීමේදී මූලික තැන්පතුව සඳහා රු.4,500,000 ක් ගෙවා තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටු ඇගයීම් අවස්ථාවේදී මෙවැනි තැන්පතුවක් තැබිය යුතු බවට කිසිදු එකඟවීමක් නොමැතිව අනුමැතියකින් තොරව මූලික තැන්පතුවක් ලබාදී තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු.7,418,327 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,283,016 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,701,343 ක වර්ධනය සඳහා රජයේ ප්‍රධාන රු.150,578,000 ක් සහ පොළී ආදායම් සහ අනෙකුත් ආදායම් රු.1,483,270 ක් වැඩිවීම බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

---------------

අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අවතැන් වූවන් පුනරුත්ථාපනය කිරීමට ණය ව්‍යාපෘති තුනක් යටතේ මූල්‍ය ආයතන මඟින් රු.843,200,000 ක ණය මුදලක් ප්‍රතිලාභීන් 6,317 දෙනෙකු වෙත නිකුත් කිරීමට අරමුණු කර තිබුණද, ප්‍රතිලාභීන් 1,216 ක් සඳහා පමණක් රු.170,533,000 ක ණය නිකුත් කර තිබුණත් සමස්ත ප්‍රගතිය සියයට 20 ක අවම මට්ටමක පැවතුණි. ණය ව්‍යාපෘතිවලින් ප්‍රධාන ව්‍යාපෘතියක් වූ ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ රු.745,000,000 ක් ප්‍රතිලාභීන් 5,707 කට ණය නිකුත් කිරීමට සැලසුම් කළද තථ්‍ය වශයෙන් ප්‍රතිලාභීන් 1,202 ක් සඳහා රු.167,233,000 ණය නිකුත් කර තිබූ බැවින් සියයට 22 කටත් අඩු ප්‍රගතියක් නිරීක්ෂණය විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). අධිකාරිය විසින් ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම උදෙසා නිවාස සංවර්ධන අධිකාරිය වෙත දී තිබූ මුදලින් ගිවිසුම් කාල සීමාව අවසන්ව තිබුණ ද අයවීමට ඇති රු. මිලියන 123.2 ක් සහ ඊට අදාල පොළිය අය කරගෙන නොතිබුණි.

(ආ). රට තුළ සිදුවූ අභ්‍යන්තර ගැටුම් මත දේපල යථාවත් කිරීමට සහ ස්වයං රැකියා සඳහා 1983 වර්ෂයේදී ප්‍රතිලාභීන්ට ලබාදී තිබූ රු.76,631,093 ක ණය මුදල් මෙතෙක් අයවී නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී අධිකාරි කාර්යාලය නව කුළී ගොඩනැගිල්ලකට ගෙනයාමේදී මාසික කුළිය රු.750,000 ක් කුළී හිමියාට ගෙවීමට එකඟ වී තිබුණ ද එහි රජයේ තක්සේරුකරුගේ තක්සේරුව රු.700,000 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වන්දි ගෙවීමට ප්‍රතිපාදන ලෙස භාණ්ඩාගාරයෙන් රු.200,000,000 මුදලක් ලැබී තිබූ අතර එම මුදලින් මරණ හා තුවාල සහ දේපල වන්දි ගෙවීම සඳහා රු.188,194,294 ක් වැයකර තිබුණි. ප්‍රතිලාභීන් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීමේ උත්සවය සඳහා ආහාර වලට රු.1,383,769 ක් ද බස් රථ සඳහා ප්‍රවාහන වියදම් ලෙස රු.1,698,820 ක් වැයකර ඒවාද වන්දි ගෙවීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජුනි 02 දින අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම උදෙසා සංයුක්ත සැලැස්මක් 2012 – 2016 කාලය සඳහා සකස් කර තිබූ නමුත් එය යාවත්කාලීනව සංශෝධනය කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

අධිකාරිය විසින් 2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

----------------------

අධිකාරියේ සියළු ගනුදෙනු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) අයවැය
(ඇ) නිවාස ආධාර ව්‍යාපෘති
(ඉ) වන්දි ගෙවීම්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# පුනරුත්ථාපන අධිකාරිය

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

## புனர்வாழ்வு அதிகாரசபை

ஆட்களையும், ஆதனங்களையும், கைத்தொழில்களையும் புனரமைப்புச்செய்யும் அதிகாரசபை

புனர்வாழ்வு மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சு

## Rehabilitation Authority

Rehabilitation of Persons, Properties and Industries Authority

Ministry of Rehabilitation and Prison Reforms

මගේ අංකය/எனது இல./ My No: REP / AUDIT / F / 2013

ඔබේ අංකය/உமது இல./Your No:

දිනය/திகதி/Date: 26.08.2014

විගණකාධිපති.

විගණකාධිපති දෙපාර්තමේන්තුව.

බත්තරමුල්ල.

**<u>තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ ව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 ( 2 ) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ JP / A / REPPIA / 1 / 13 / 33 හා 2014 අගෝස්තු 15 වන දිනැති කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් මාගේ නිරීක්ෂණයන් පහතින් දක්වා ඇත.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.2.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති</u>

( අ ). සහ ( ආ ). අප විසින් පිළියෙල කරන ලද අවසාන ගිණුම් ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මුල් වරට යොදාගනු ලැබුයේ 2013 වර්ෂයේ දී ය. එබැවින් ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී සිදු වූ ආකෘතිමය අඩුපාඩු 2014 වර්ෂයේ අවසාන ගිණුම් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

( අ ). නිරීක්ෂණය නිවැරදි ය. නිසි පරිදි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනණය තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමට කටයුතු කෙරෙමින් පවතී. එමෙන් ම 2013 වර්ෂයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයේ දී සිදු වූ දෝෂයන් 2014 වර්ෂයේ අවසන් ගිණුම්වලින් ගැලපීමට කටයුතු කරමි.

( ආ ). 2014 වර්ෂයේ අවසන් ගිණුම්වලට ඇතුළත් කර අදාළ ගැලපීම් සිදු කරමි.

අංක. 59, ඩී.එස්. සේනානායක මාවත, කොළඹ- 08.
இல. 59, டி.எஸ்.சேனாநாயக்க மாவத்தை, கொழும்பு- 08.
No. 59, D.S. Senanayaka Mawatha, Colombo- 08.

කාර්යාලය / காரியாலயம் / Office 011 2691555
ඊ මේල් / ஈ- மெயில் / E- mail reppia.gen@sltnet.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax 011 2691552

2.2.3 නො සැසඳූ පාලන ගිණුම්

ආයතනයේ එක් එක් වන්දි අංශ මගින් නඩත්තු කරනු ලබන වන්දි ගෙවීම් ලේඛනවල මාසික ශේෂයන්, ගිණුම් අංශය විසින් නඩත්තු කරනු ලබන අදාළ වැය ලෙජරවල මාසික ශේෂයන් හා මාසය අවසානයේ දී ගැලපුම් කිරීමට කටයුතු කිරීමෙන් එම ලේඛන අතර, පවතින ශේෂ විෂමතාවයන් තුලනය කිරීමට ඉදිරියේ දී වගබලා ගනිමි. ප්‍රගති වාර්තා සකස් කිරීමේ දී 2013 වසරතුළ දී එකී සන්සන්දනයන් සිදු කර ඇත.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නො වීම

( අ ). පෙර කාර්යාලයය පරිශ්‍රය පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ලේ අයිතිකරුවන්ගේ දැඩි බලපෑම මත 2013 දෙසැම්බර 31 දිනය වන විට කාර්යාලයය පරිශ්‍රය අදාළ ගොඩනැගිල්ලෙන් ඉවත් කර ගැනීම අනිවාර්යය විය. එමෙන් ම අදාළ කාමර වෙන් කිරීමේ සැලැස්ම මීට පෙර අධිකාරිය විසින් කුලී පදනම ලබා ගැනීමට යෝජනා කරන ලද ගොඩනැගිල්ලක් වෙනුවෙන් සකස් කර තිබූ අතර, එය නව පරිශ්‍රයට ගැලපෙන පරිදි සුළු වෙනස්කම් සිදු කර සභාපතිගේ පූර්ව අනුමැතිය ඇති ව පැනනැගුණු දැඩි අවශ්‍යතාවය මත තෝරා ගන්නා ලදී,

( ආ ). නිරීක්ෂණ නිවැරදි ය. කලින් අධිකාරිය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ කාමර වෙන් කිරීම සඳහා යොදාගත් ද්‍රව්‍ය අතරින් නව ගොඩනැගිල්ලට යොදාගත් ද්‍රව්‍ය හා යොදා ගැනීමට නො හැකි වූ ද්‍රව්‍යයන් පිළිබඳ ව ලේඛනයක් වෙන් වෙන් වශයෙන් ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. එමෙන් ම ප්‍රයෝජනයට ගත නො හැකි කොටස් ඉදිරි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීමට ද කටයුතු කරමි.

2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නො වීම

( අ ). ක්ෂේත්‍ර රාජකාරීවල නියුක්තවීමේ දී ආහාරපාන හා අනෙකුත් නවාතැන් සඳහා අත්තිකාරම් ලබා ගන්නා කිසිදු අවස්ථාවක සංයුක්ත දීමනා ලබා නොමැත.

( ආ ). ණය ක්‍රමයන්ට අදාළ ක්ෂේත්‍ර රාජකාරී සඳහා පමණක් පවත්නා දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ගෙවනු ලබන විශේෂ දීමනාව කි. එහෙයින් එකී දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත් ව මසකට උපරිම දින 05 කට සීමා කොට අදාළ ණය ක්‍රමය සඳහා ලබා ගන්නා 1 % ක සේවා ගාස්තුව උපයෝගී කර ගනිමින් ගෙවීම් කරනු ලැබේ.

( ඇ ). නිරීක්ෂණ නිවැරදි ය. ඒ අනුව 2014 වර්ෂයේ සිට විධිමත් පරිදි ස්ථාවර වත්කම් ගිණුම්ගත කර ස්ථාවර වත්කම් ලේඛනය නිසි අයුරින් නඩත්තු කිරීමට කටයුතු යොදා ඇත.

( ඈ ). 396 ( ඈ ) මුදල් රෙගුලාසි ප්‍රකාර ව සඳහන් කරන ලද රු.609,433.00 ක චෙක්පත් 09 සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කර ඇත. ඉදිරියේදි චෙක්පත් සම්බන්ධයෙන් 396 ( ඈ ) මුදල් රෙගුලාසි ප්‍රකාර ව කටයුතු කිරීමට තරයේ වගබලා ගනිමි.

( ඉ ). මෙකී ණය මුදල් අදාළ නිලධාරීන්ට ලබා දී තිබුණේ එකී චක්‍රලේඛය නිකුත් කිරීමට පෙරාතුව ය. කෙසේ නමුත් ඉදිරියේ දී අංක. 30/2008 හා 2008 දෙසැම්බර් 31 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර ව ආයතනයේ නිලධාරීන් හට ආපදා ණය ලබාදීම සිදු කරමි.

( ඊ ). කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 / 31 ( 1 ) අනුව මෙම අධිකාරියේ වැටුප් නිසි පරිදි සකස් කර ඇත. 2014 ජූලි මස සිට අදාළ ගැලපීම් දීමනාව ගෙවීම අත්හිටුවා ඇත.

<u>2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

පැරණි ගොඩනැගිල්ලේ ඉවත්වීමේ දී ඒ තුළ ම කාර්යාලයය රඳවා ගැනීම සඳහා එහි හිමිකරුවන් දැඩි පරිශ්‍රමයක නිරත වූ අතර ප්‍රායෝගික සංකීර්ණතාවය මත මුලදී මෙම තැන්පතුව පිළිබඳ ව සඳහන් නො වූ නමුත් වෙනත් විකල්පයක් නො වූ බැවින් ද අවසානයේ නව ගොඩනැගිල්ලට පිවිසීමේ දී මෙබඳු තැන්පතුවක් අවශ්‍ය බව දන්වා ඇත. ඒ අනුව හදිසි හා අත්‍යාවශ්‍ය වූ බැවින් මෙවැන්නක් සිදු විය.

නීති උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් කාලයක් නො වූ හෙයින් නීතිඥ ආයතනයක සහය ලබා ගත් අතර නීතිඥ ගාස්තු වශයෙන් ගෙවා ඇත්තේ අප විසින් ගෙවිය යුතු අර්ධය පමණි.

මෙම සියළු ඉදි කිරීම් හා සැකසීම් අධිකාරියේ අවශ්‍යතාවය මත අත්‍යාවශ්‍ය කරුණක් විය.

<u>3. මූල්‍ය සමාලෝචනය</u>

<u>3.1 මූල්‍ය ප්‍රතිඵල</u>

නිරීක්ෂණ නිවැරදි ය.

<u>4. මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 කාර්ය සාධනය

ස්වයං රැකියා ණය ක්‍රමය - 2013 වසර තුළ ණයලාභීන් 2031 ක් වෙනුවෙන් නිර්දේශ ලබා දී තිබූ නමුදු ප්‍රමාණවත් ප්‍රගතියක් නොමැති වීම පිළි ගන්නා අතර අදාළ ගැටළු පිළිබඳ ව ලංකා බැංකුව සමග සාකච්ඡා කළ අතර එය මග හරවා ගැනීමට කටයුතු කරමි.

නිවාස ණය ක්‍රමය යටතේ නිවාස අධිකාරිය සමග ඒකාබද්ධ වැඩ සටහනක් ක්‍රියාවට නගා ගැනීමට නො හැකි වීම හේතුවෙන් අදාළ ප්‍රගතිය ළඟාකර ගත නො හැකි විය.

සමාජගත කරන අභ්‍යාසලාභීන් වෙනුවෙන් වූ ස්වයං රැකියා ණය ක්‍රමයේ 2 වන අදියර 2013 වසර තුළ ආරම්භ කිරීමට මුල දී අපේක්ෂා කළ ද එය ප්‍රමාද වීම, අදාළ ප්‍රගතිය අඩුවීමට හේතු විය.

රජයේ සේවක මරණ වන්දි ක්‍රමයේ 67.5 % ක ප්‍රගතියක් ලඟා කර ගත් අතර උපරිමය කරා ලඟාවීමට නො හැකි වූයේ සම්පූර්ණ කරන ලද ලිපිගොනු නොමැති වීම හේතු කොටගෙන ය.

විවාහ සම්බද්ධ දීමනා ක්‍රමයේ පැවති විශේෂ ගැටළුවක් හේතුවෙන් 2013 වසරතුළ ගෙවීම් නතර කිරීමට සිදු විය.

<u>4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

( අ ). අයවිය යුතු රු.44,300.00 ක මුදල ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර එසේ නො වන්නේ නම්, නීති මඟින් අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කරමි.

( ආ ). ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතී.

( ඇ ). මූල්‍ය ආයතන සමග මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී ණය නිකුත් කරනු ලබන ප්‍රමාණය මත, ඒ ඒ කාල පරිච්ඡේදය සඳහා වක්‍රීය අරමුදල් මූල්‍ය ආයතන වෙත නිදහස් කිරීම සිදු වේ. මෙය දෙපාර්ශවය අතර, ඇති කරගත් ණය ගිවිසුමේ සී වගන්තිය අනුව සිදු කරනු ලැබේ. ඉදිරියේ දී මෙම තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කරමි.

( ඈ ). මෙම ණය මුදල කපා හැරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර  මු.රෙ 113 ප්‍රකාර ව කටයුතු කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

( අ ). ආයතනයේ යම් සේවා කටයුත්තක් ඉටු කිරීම සඳහා ආයතනයේ සේවකයින් ඉදිරිපත් වන්නේ නම් ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ 2.2 වගන්තියට අනුව සාමාන්‍ය රාජකාරිවලට බාධා නො වන පරිදි කාර්යාල වේලාවෙන් බාහිර ව කරනු ලබන කාර්යාලීය නො වන වැඩ වෙනුවෙන් ලැබෙන සම්පූර්ණ ගාස්තුව ම නිලධාරියාගේ ප්‍රයෝජනයට ගැනීමට ඉඩදිය හැකි ය. එසේ ම මෙම කාර්යය සඳහා  සුභසාධක සංගමය මගින් ලබා ගත් මුදල වෙළඳ පළ මිල ගණන් අනුව 10 % කට වඩා වැඩි අගයකින් රජය වෙත ඉතුරුම් වශයෙන් වූ අගය කි.

( ආ ). රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම රු. 700,000.00 වුව ද ජනාකීර්ණ බොරැල්ල නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම ගොඩනැගිල්ලේ වානිජ වටිනාකම ( Commercial Value ) වැඩි අගයක් ගනු ලබයි.

( ඇ ). භාණ්ඩාගාරයෙන් වන්දි සඳහා ලැබුණු ප්‍රතිපාදනවලින් වන්දි ගෙවීම් සඳහා රු. 188,194,294.00 ක මුදලක් ද ප්‍රතිලාභීන් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීමේ උත්සවයේ ආහාර සඳහා රු. 1,383,769.00 ක් හා ප්‍රවාහන වියදම් ලෙස රු. 1,698,820.00 ක මුදලක් දැරීමට සිදු වුයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලිය ගහ මන්දිරයේ පැවති වන්දි ප්‍රදානය කිරීමේ උත්සවයේ වියදම් වශයෙනි. එය වන්දි ගෙවීම සඳහා අදාළ වියදම් වේ. කෙසේ නමුත් ආයතනය පවත්වා ගෙනයාම සඳහා අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් වැය කරන ලද වියදම් භාණ්ඩාගාරය මගින් අමතර ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද කිසිදු මුදලක් ප්‍රවර්තන වර්ෂයේ දී අමතර වශයෙන් ලැබී නොමැත.

4.4 දූෂ්‍ය අක්‍රමිකතා

වර්තමානය වන විට මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාර උපරිම අග්‍රිම සීමාව රාජකාරිය වඩාත් ඵලදායී අයුරින් සිදු කිරීමේ දී ප්‍රායෝගික නො වන හෙයින් අවශ්‍යතාවය හා අවම වශයෙන් වන මුදල් අවශ්‍යතාවය පිළිබඳ ව අධිකාරි අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්වත් කිරීමෙන් පසු ව එකී අනුමැතියට යටත් ව සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා ගැනීමට සිදු විය.

4.5 සේවක පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

2013 වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නො වු හෙයින් 2013 වර්ෂයේ දී ආයෝජනය කළ යුතු සම්පූර්ණ මුදල ම ආයෝජනය කළ නො හැකි විය. 2013 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් මේ සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද එය ගෙවිය යුතු වුවත් මේ අවස්ථාවේ දී ඒ සඳහා ප්‍රතිපාදන සපයා දිය නො හැකි බව දන්වා සිටින ලදි, කෙසේ නමුත්   2014 වර්ෂයේ මුල් භාගය වන විට ඉන් රු. 1,500,000.00 ක මුදලක් ආයෝජනය කර ඇත. ඉතිරි මුදල 2014 අවසානය වන විට ප්‍රතිපාදන සලසා ගැනීමේ හැකියාව මත ආයෝජනය කිරීමට උපරිමයෙන් කටයුතු කරමි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

වර්තමානයේ දී භාණ්ඩාගාරය විසින් ආදායම් නො ලබන අර්ධ රාජ්‍ය ආයතන සඳහා මෙබඳු සංයුත්ක සැලැස්මක් සැකසීම අත්‍යවශ්‍ය නො වන බව දන්වා ඇත.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

වර්ෂය ආරම්භයේ දී මේ සඳහා ඉතා සුළු මුදලක් වෙන්කර තිබූ හෙයින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නො තිබුණි. එයට හේතුව සීමිත වූ වත්කම් ප්‍රමාණයක් මිල දී ගත හැකි වීමයි. කෙසේ නමුත් වර්ෂය අවසාන වන විට පැන නැගුණු අත්‍යවශ්‍ය කාරණා හේතුවෙන් විවිධ ආදායම් ප්‍රභවයන් මඟින් ලද මුදලින් වත්කම් මිලදී ගැනීම සඳහා කටයුතු කර තිබුණි. කෙසේ නමුත් 2014 වර්ෂයේ සිට ක්‍රමවත් පරිදි මෙබඳු සැලැස්මක් සකස් කරමි.

### 5.4 අභ්‍යන්තර විගණනය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණයට යටත් ව අධිකාරියේ සියළු ගනුදෙනු ආවරණය වන සේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වේ.

## 6. පද්ධති හා පාලනයන්

( අ ). ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත් පරිදි පවත්වා ගෙන යාමත් යාවත්කාලීන කිරීමත් සිදු කරගෙන යනු ලැබේ.

( ආ ) , ( ඇ ) සහ ( ඈ ).

නිසි පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුම්වත් කර ඇත.

ටී. ඒ. සමරසිංහ.

සභාපති.

පුනරුත්ථාපන අධිකාරිය.